(Sinhala Version)

ඕ.එච් ගිවිසුම් අංකය ජේ 699175

# රැකියා ගිවිසුම

## (විදේශයකින් සේවයට බඳවා ගත් ගෘහ සහායකයෙකු සඳහා)

මෙම ගිවිසුම ........................................... ("සේවා යෝජකයා") සහ .......................................
("සහායක") අතර ..................දින ඇති කර ගන්නා අතර එහි පහත නියමයන් අඩංගු වේ:

1. මෙම ගිවිසුමේ අරමුණු සඳහා සහායකයා පැමිණි ස්ථානය ............................ වේ.

2. (අ)+සහායකයා හොංකොංවලට පැමිණෙන දිනෙන් ආරම්භව වර්ෂ දෙකක කාලයක් සඳහා සේවා යෝජකයා විසින් සහායකයා සේවයේ යොදවා ගත යුතුය.

   (ආ)+සහායකයා ................දින වන ගෘහ සේවිකා ගිවිසුම් අංක ........... දරන ගිවිසුම කල් ඉකුත් වන දින දක්වා එකම සේවා යෝජකයා වෙනුවෙන් සේවය කළ යුතුය.

   (ඇ)+ ආගමන අධ්‍යක්ෂවරයා විසින් මේ ගිවිසුම යටතේ සේවය කිරීම ආරම්භ කිරීම සඳහා හොංකොංහි රැඳී සිටීමට ඇයට අවසර දෙන දිනයේ සිට වර්ෂ දෙකක කාලයක් සඳහා ගෘහ සහායකයකු වශයෙන් සේවා යෝජකයා විසින් වර්ෂ දෙකක් සේවයෙහි යොදවා ගත යුතුය.

3. හායකයා ............................ දරන ස්ථානයේ සේවා යෝජකයාගේ නිවසේ වැඩ කළ යුතු අතර සහ පදිංචිව සිටිය යුතුය.

4. (අ) සහායකයා විසින් මීට අමුණා ඇති සේවා යෝජකයාගේ නවාතැන් සහ ගෘහස්ථ රාජකාරි පිළිබඳ උපලේඛනය අනුව පමණක් ගෘහස්ත රාජකාරි සිදු කළ යුතුය.

   (ආ) සේවා යෝජකයා විසින් සහායකයා වෙනත් පුද්ගලයකු සමග කරන වෙනත් රැකියාවක් පැවරීම නොකළ යුතු අතර සහායකයාද එය නොකළ යුතුය.

   (ඇ) සේවා යෝජකයා සහ සහායකයා විසින් මෙම ගිවිසුම යටතේ සහායකයා හොංකොංහි වැඩ කිරීමට පිළිගැනීම මත ආගමන දෙපාර්තමේන්තුව විසින් පනවනු ලබන නැවතීමේ කොන්දේසි 4 (අ) සහ (ආ) වගන්තියේ ඇතුළත් වන බව පිළිගනිති. එම නැවතීමේ කොන්දේසිවලින් එකක් හෝ දෙකම කඩ කිරීම නිසා සහායකයාට අපරාධ නඩු පවරනු ලැබීමට යටත් විය හැක.

5 (අ) සේවා යෝජකයා විසින් සහායකයා මසකට හොං කොං ඩොලර් ............ක වැටුපක් ගෙවිය යුතුය. වැටුප හොංකොං රජයේ විශේෂ පරිපාලන කලාපය විසින් නියම කර ඇති ගිවිසුමේ දිනයේදී බලපැවැත්වෙන අවම වැටුපට වඩා අඩු නොවිය යුතුය. මේ රැකියා ගිවිසුම යටතේ ගෙවිය යුතු වැටුප ගෙවීම පැහැර හරින සේවා යෝජකයකුට එරෙහිව අපරාධ නඩුවක් පැවරිය හැක.

   (ආ) සේවා යෝජකයා විසින් මීට අමුණා ඇති නවාතැන් සහ ගෘහස්ත රාජකාරි උපලේඛනය අනුව බඩු භාණ්ඩ සහිත සුදුසු නවාතැනක් සහායකයාට නොමිලේ සැපයිය යුතුය. ආහාර සපයන්නේ නැත්නම් මසකට හොංකොං ඩොලර්............ක ආහාර දීමනාවක් සහායකයාට ගෙවිය යුතුය.

---

*සඳස පරිදි මකන්න.
+සුදුසු පරිදි 2අ 2ආහෝ 2ඇ වගන්ති භාවිතා කරන්න

(ඇ) සේවා යෝජකයා විසින් වැටුප් සහ ආහාර දීමනාව සඳහා රිසිට්පතක් සැපයයිය යුතු අතර සහායකයා ඔහුගේ/ඇයගේ අත්සන තබා රිසිට් පත භාර ගත යුතුය.

6. සහායකයාට සේවක ආඥා පනතේ 57වන වගන්තියේ දක්වා ඇති පරිදි සියළු විවේක දින, ව්‍යවස්ථානුකූල නිවාඩු ගෙවීම් සහිත වාර්ෂික නිවාඩු , සඳහා හිමිකම තිබිය යුතුය.

7. (අ) සේවා යෝජකයා විසින් සහායකයා පදිංචිව සිටින ස්ථානයේ සිට ඔහුට/ඇයට* නොමිලේ ගමන් පහසුකම් සැලසිය යුතුය. තවද සේවා ගිවිසුම අවසන් වූ පසු හෝ කල් ඉකුත් වූ පසු හොංකොංවල සිට ඔහු/ඇය* පදිංචි ස්ථානයටද ආපසු නොමිලේ ගමන් පහසුකම් සැලසිය යුතුය.

(ආ) ගමන වඩාත්ම ඍජු මාර්ගය හරහා සිදු වේ නම් දිනකටHK$100ක් ඔහු/ඇය*ඔහුගේ/ඇයගේ* පදිංචිව සිටින ස්ථානයේ සිට ඔහු/ඇය* හොංකොංවලට පැමිණෙන දිනය දක්වා සහායකයාට ගෙවිය යුතුය. එම මුදලම ගිවිසුම කල් ඉකුත් වූ විට හෝ එය අවසන් කළ විට ඔහු/ඇය * පදිංචි රටට යන විටද ගෙවිය යුතුය.

8. සහායකයා ඔහු/ඇය පදිංචි ස්ථානයේ සිට පිටත් වී හොංකොංවලට ඇතුළත්වීම දක්වා පහත සඳහන් ගාස්තු සහ වියදම් (තිබේ නම්) ගෙවීම සඳහා සේවා යෝජකයා වග කිව යුතු වෙයි.: —
   (i) වෛද්‍ය පරීක්ෂණ ගාස්තු;
   (ii) අදාළ කන්සියුලර් කාර්යාලය මගින් සහතික කිරීමේ ගාස්තු;
   (iii) වීසා ගාස්තු;
   (iv) රක්ෂණ ගාස්තු;
   (v) පරිපාලනන ගාස්තු සහ පිලිපීන විදේශ සේවා පරිපාලන ගාස්තු හෝ අදාළ රාජ්‍ය ආයතන විසින් නියම කර ඇති ඒ හා සමාන වෙනත් ගාස්තු ; සහ
   (vi) වෙනත්: ..............................................................................................................................

සහායකයා විසින් ඉහත ගාස්තු සහ වියදම් ගෙවා ඇති අවස්ථාවක අදාළ ලදුපත් සහ ගෙවීම පිළිබඳ ලේඛනමය සාක්ෂි සහිතව සහායකයා විසින් එම මුදල් ඉල්ලා සිටියහොත් එසේ ගෙවන ලද මුදල් ප්‍රමාණය සම්පූර්ණයෙන්ම සේවා යෝජකයා විසින්සහායකයාට ගෙවිය යුතුය.

9. (අ) සහායකයා ඔහුගේ/ඇයගේ* කැමැත්තෙන්ම සහ ඔහුගේ/ඇයගේම* අරමුණු මත හොංකොංවලින් පිටත්ව සිටිනකාල සීමාවේදී හැර, සහායකයා අසනීපයෙන් පසුවේ නම් හෝ 2වන වගන්තියේ දක්වා ඇති කාලසීමාව තුළ පුද්ගලික තුවාලයකින් පීඩා විඳියි නම්, සේවා යෝජකයා විසින් සහායකයාට නොමිලේ වෛද්‍ය ප්‍රතිකාර සැපයිය යුතුය. නොමිලේ ලබා දෙන ප්‍රතිකාරවලට වෛද්‍ය උපදෙස්, රෝහලේ නැවතී සිටීම සහ හදිසි දන්ත ප්‍රතිකාර ඇතුළත් වේ. සහායකයා විසින් ඕනෑම ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකයකු විසින් සපයන වෛද්‍ය ප්‍රතිකාර ලබා ගත යුතුය.

(ආ) සහායකයා හදිසි අනතුරක් හෝ රැකියාව හේතුවෙන් ඇතිවන වෘත්තීය රෝගයකින් පෙළෙන්නේ නම්, සේවා යෝජකයා විසින් සේවක වන්දි ආඥා පනතේ 282 පරිච්ඡේදය අනුව ගෙවීම් කළ යුතුය.

(ඇ) වෛද්‍ය වෘත්තිකයකු වැඩි දුර සේවය සඳහා සහායකයා සෞඛ්‍ය සම්පන්න නොවන බව සහතික කළොත් සේවා යෝජකයාට අදාළ ආඥා පනත්වල ව්‍යවස්ථාපිත විධිවිධානවලට අනුව සේවය අවසන් කළ හැක. තවද 7වන වගන්තිය අනුව ඔහු/ඇයව* පැමිණි ස්ථානයට පිටත් කිරීමටද වහාම පියවර ගත යුතුය.

10. ඕනෑම පාර්ශවයකට එක් මසක ලිඛිත දැනුම් දීමක් කිරීමෙන් පසු හෝ දැනුම් දීම වෙනුවට එක් මසක වැටුප කැප කර ගිවිසුම අවසාන කළ හැක.

11. 10වන වගන්තියේ කුමක් සඳහන් වුවද සේවක ආඥා පනතේ 57වන පරිච්ඡේදය අනුව ඉඩදී ඇති අවස්ථාවල ඕනෑ ම පාර්ශවයකට දැනුම්දීමක් හෝ ගෙවීමක් රහිතව ලිඛිතව මෙම ගිවිසුම අවසාන කළ හැක.

12. මෙම ගිවිසුම අවසන් කළහොත් සේවා යෝජකයා සහ සහායකයා යන දෙදෙනාම ආගමන අධ්‍යක්ෂට අවසන් කිරීමේ දින සිට දින හතක් ඇතුළත ලිඛිතව ඒ ගැන දැනුම් දිය යුතුය. අනෙක් පාර්ශවය විසින් සේවය අවසන් කිරීම පිළිබඳ ලිඛිත පිළිගැනීමක්ද ආගමන අධ්‍යක්ෂවරයාට යොමු කළ යුතුය.

13. පාර්ශවයන් දෙකම පැවති ගිවිසුම කල් ඉකුත් වූ පසු නව ගිවිසුමකට ඇතුළත් වීමට එකග වුවහොත් වැඩිදුර කාලයක් ගත වීමට පෙර සේවා යෝජකයාගේ වියදමින් ගෙවීම් සහිත/රහිත* නිවාඩුවක් සඳහා සහායකයාඔහු/ඇය පැමිණි ස්ථානයට යා යුතුය. ආගමන විගමන අධ්‍යක්ෂවරයාගෙන් වැඩි දුර නැවතී සිටීම සඳහා පූර්ව අනුමැතිය ලබා ගෙන නැත්නම් එම නිවාඩුව දින හතකට නොඅඩු විය යුතුය.

---

*සුදුසු පරිදි මකන්න.

14. සහායකයා මියගියහොත් ඔහුගේ/ඇයගේ* දේහය හොංකොංහි සිට ඔහුගේ/ඇයගේ පදිංචි ස්ථානයට ප්‍රවාහනය කිරීම සඳහා වූ ගාස්තු සේවා යෝජකයා විසින් ගෙවිය යුතුය.

15. පහත හේතු හැර මෙම ගිවිසුමේ නියමයන්ට එය පවතින කාලයේදී සිදුවන යම් වෙනස් වීමක් හෝ එකතු වීමක් (නවාතැන් සහ ගෘහස්ත රාජකාරි පිළිබඳ අමුණා ඇති උපලේඛනයද ඇතුළුව)හොංකොංහි කම්කරු කොමසාරිස්වරයාගේ පූර්ව අනුමැතිය යටතේ සිදුවී නොමැති නම් බල රහිත විය යුතුය:

(අ) ආගමන අධ්‍යක්ෂවරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය සහිතව අන්‍යෝන්‍ය එකගතාව මත 2වන වගන්තියේ දක්වා ඇති සේවා කාලය එක් මසකට නොඅඩු කාල සීමාවකින් දික් කිරීම;

(ආ) ආගමන අධ්‍යක්ෂවරයාට ලිඛිතව දැනුම් දීමෙන් අනතුරුව 3වන වගන්තියේ දක්වා ඇති පරිදි සේවා යෝජකයා පදිංචි ලිපිනයෙහි යම් වෙනස්කමක් සිදු වුනොත් සහ සහායකයා සේවා යෝජකයාගේ නව පදිංචි ලිපිනයෙහි දිගටම වැඩ කරන්නේ නම් සහ පදිංචිව සිටින්නේ නම්;

(ඇ) නවාතැන් සහ ගෘහස්ත රාජකාරි පිළිබඳ උපලේඛනයේ 6වන කොටස අනුව දක්වා ඇති පරිදි එහි යම් වෙනස් කිරීමක් කර ඇත්නම්; සහ

(ඈ) මෝටර් රථයක් පැදවීම සම්බන්ධයෙන් නවාතැන් සහ ගෘහස්ත රාජකාරි පිළිබඳ උපලේඛනයේ 4 කොටසේ යම් වෙනස්කමක් සිදු වුවහොත්, එනම් සේවා යෝජකයාට මෝටර් රථය අයත් වුවද නැති වුවද උපලේඛනයට එකතු කිරීමක් ආකාරයෙන් සහායකයා සමග අන්‍යෝන්‍ය එකගතාවෙන් ආගමන අධයක්ෂවරයා විසින් සහායකයාට රියැදුරු රාජකාරි කිරීමට ලිඛිතඅවසරය දී ඇති විට

16. ඉහත නියමයන් මගින් සහායකයා සේවක ආඥා පනතේ 57 වන වගන්තිය, සේවක වන්දි ආඥා පනතේ 282 වගන්තිය සහ වෙනත් යම් අදාළ ආඥා පනත් අනුව වූ සහායකයාගේ වෙනත් අයිතිවාසිකම් වළක්වනු නොලැබිය යුතුය

17. සහායකයා ඔහු/ඇය ගෘහස්ථ සහායකයන් ලෙස රැකියාවෙහි යෙදීමට සුදුසුද යන්න තීරණය කිරීම සඳහා වෛද්‍ය පරීක්ෂණයට භාජනය කළ බවත් ඔහුගේ/ඇයගේ වෛද්‍ය සහතිකය සේවායෝජකයා විසින් පරීක්ෂා කරනු ලැබීමට ඉදිරිපත් කර ඇති බවත් පාර්ශවකරුවෝ මෙයින් ප්‍රකාශ කර සිටිති

සේවා යෝජකයා විසින් පහත අය ඉදිරියේ අත්සන් කරන ලදි ______________________

(සේවා යෝජකයාගේ අත්සන)

ඉදිරියේදීය, ______________________ ______________________

(සාක්ෂිකරුවන්ගේ නම්)(සාක්ෂිකරුවන්ගේ අත්සන)

______________________

සහායකයා විසින් පහත අය ඉදිරියේ අත්සන් කරන ලදි(සහායකයාගේ අත්සන)

ඉදිරියේදීය, ______________________ ______________________

(සාක්ෂිකරුවන්ගේ නම්)(සාක්ෂිකරුවන්ගේ අත්සන)

* සුදුසු පරිදි මකන්න.

# නවාතැන් සහ ගෘහස්ත රාජකාරි පිළිබඳ උපලේඛනය

1. සේවා යෝජකයා සහ සහායකයා යන දෙදෙනාම පුද්ගලික දත්ත (පෞද්ගලිකත්ව) ආඥා පනත අනුව උපලේඛනයෙහි සඳහන් තොරතුරු එකතු කිරීමට සහ භාවිතා කිරීමට ආගමන දෙපාර්තුමේන්තුවට සහ වෙනත් අදාළ රජයේ බලධාරීන්ට කැමැත්ත තහවුරු කිරීමට සහ එම උපලේඛනය ඔවුන් කියවා ඇති බව සහ එහි අන්තර්ගතයන්ට එකග වන බව පිළිගැනීමට උපලේඛනය අත්සන් කළ යුතුය.

2. සේවා යෝජකයා පදිංචි ස්ථානය සහ වැඩ කළ යුතු පුද්ගලයන් ගණන
   අ. තට්ටු නිවාසයේ/නිවසේ ප්‍රමාණය ආසන්න වශයෙන්වර්ග අඩි/ වර්ගමීටර්*......... කි
   ආ. නිතර වැඩ කළ යුතු ගෙදර සිටින පුද්ගලයන්ගේ ගණන පහත සඳහන් කරන්න:
   වැඩිහිටියන් ............. බාල වයස්කරුවන් (අවුරුදු 5ට අඩු) .......... (අවුරුදු 5සිට 18 දක්වා) .......... ගර්භණී ........... නිරන්තරයෙන් රැක බලා ගත යුතු සහ අවධානය අවශ්‍ය පුද්ගලයින් ගණන (ළදරුවන් හැර).
   (සටහන: නිවසේ වැඩ කිරීමට සේවා යෝජකයා විසින් දැනට සේවයේ යොදවා ඇති සහායකයාන් ගණන ...................... )

3. සහායකයාට නවාතැන් සහ පහසුකම් සැපයීම

අ. සහායකයාගේ නවාතැන්

හොංකොංහි සාමාන්‍ය තට්ටු නිවාසයක විශාලත්වය සාපේක්ෂව කුඩාය. වෙනමම සේවකයන් සඳහා කාමරයක් ලබා දීම බහුලව සිදු නොවුනත්, සේවා යෝජකයා විසින් සහායකයාට සෑහෙන පෞද්ගලිකත්වයක් ඇති සුදුසු නවාතැනක් සැපයිය යුතුය. නුසුදුසු නවාතැන් සඳහා උදාහරණ නම්: සහායකයාට පෞද්ගලිකත්වය අඩු තැනක් වන කොරිඩෝව මත නිදා ගැනීමට සිදුවීම හෝ එහි ඇඳක් තබා ගැනීමට සිදු වීම, විරුද්ධ ලිංගික වැඩිහිටියකු/ නව යෞවනයකු සමග කාමරයක් එකට නිදා ගැනීමට සිදු වීම.

☐ඔව්. සේවක කාමරයෙහි ඇස්තමේන්තුගත විශාලත්වය වර්ග අඩි/මීටර*...............ක් වේ.
☐නැත. සහායකයා නිදා ගන්නා ආකාරය:
- ☐අවුරුදු ....................................................................... ක ළමයකු/ළමයි සමග එක කාමරයක
- ☐වර්ග අඩි/වර්ග මීටර*......................................ක වෙන් කළ ස්ථානයක්
- ☐වෙනත්. කරුණාකර විස්තර කරන්න ...........................

ආ. සහායකයාගේ පහසුකම්:

(සටහන් කරගන්න: (අ) සිට (ඊ) දක්වා ඇති අත්‍යාවශ්‍ය පහසුකම් නොමිලේ ලබා නොදෙන්නේ නම් ඇතුළත් වීම සඳහා වීසා ඉල්ලුම්පත්‍රය සාමාන්‍යයෙන් අනුමත නොකරනු ඇත. )

| | | | | |
|---|---|---|---|---|
| (අ) | විදුලිය සහ ජල සැපයුම | ☐ඔව් | ☐ | නැත |
| (ආ) | වැසිකිලි සහ ස්නාන පහසුකම් | ☐ඔව් | ☐ | නැත |
| (ඇ) | ඇඳ | ☐ඔව් | ☐ | නැත |
| (ඈ) | බ්ලැන්කට් හෝ පිරවූ මෙට්ට | ☐ඔව් | ☐ | නැත |
| (ඉ) | කොට්ට | ☐ඔව් | ☐ | නැත |
| (ඊ) | අල්මාරි | ☐ඔව් | ☐ | නැත |
| (උ) | ශීතකරණය | ☐ඔව් | ☐ | නැත |
| (ඌ) | මේසය | ☐ඔව් | ☐ | නැත |
| (එ) | වෙනත් පහසුකම් (කරුණාකර සඳහන් කරන්න) | | | |

4. සහායකයා විසින් සේවා යෝජකයාගේ නිවසේ පමණක් ගෘහස්ත රාජකාරි කළ යුතුය. මෙම ගිවිසුම යටතේ සහායකයා විසින් කළ යුතු ගෘහස්ත රාජකාරිවලට මෝටර් රථයක් පැදවීම අදාළ නොවේ. මෙයට කවර ආකාරයේ මෝටර් රථයක්ද යන්න, කවර අරමුණක් සඳහාද යන්න සහ එය සේවා යෝජකයාට අයත් වේද නොවේද යන්න අදාළ නොවේ.

5. ගෘහස්ත රාජකාරිවලට පහත දේ ඇතුළත් වේ.
ගෘහස්ත රාජකාරිවලින් වැඩි කොටස: —
   1. ගෙදර අස්පස් කිරීම
   2. ඉවීම
   3. නිවසේ සිටින වයස්ගත අය රැක බලා ගැනීම (නිරන්තර අවධානය අවශ්‍යය/ අවශ්‍ය නැත*)
   4. ළදරුවන් බලා ගැනීම
   5. ළමයි බැලීම
   6. වෙනත් (සඳහන් කරන්න)

6. පහත මහලයේ, හෝ බැල්කනියකට (සහායකයාට වැඩකිරීමට ප්‍රමාණවත් ආරක්ෂාවක් තිබිය යුතු) හෝ පොදු කොරිඩෝවක නොපිහිටි ජනේලයක පිටත පිරිසිදු කිරීමට අවශ්‍ය වූ විටදී එය පහත කොන්දේසි වලට අනුකූලව කළ යුතුවේ.
   (i) පිරිසිදු කරනු ලබන ජනේලය දැල් ආවරණයකින් සවිකොට තිබීම හා එය අගුළුලා තිබීම හෝ එම දැල් ආවරණ විවෘත නොවන අයුරින් ආරක්ෂිත ලෙස තිබෙන බවට සහතික වීම සහ
   (ii) එසේ පිරිසිදු කිරීමේදී සහායකයාගේ "අත්" (Arms) හැර ශරීරය ජනේලයෙන් පිටතට යොමු නොවීම.

7. සේවා යෝජකයා විසින් 2, 3 සහ 5 කොටස්වල වැදගත් වෙනස් වීමක් සිදු වුනොත් ඒ බව සහායකයා සහ වාර්තා ලෙස තබා ගැනීම සඳහා ආගමන අධ්‍යක්ෂවරයා වෙත සේවා යෝජකයා සහ සහායකයා යන දෙදෙනාම විසින් අත්සන් කරන ලද සංශෝධිත නවාතැන් සහ ගෘහස්ත රාජකාරි උපලේඛනයේ (ID 407G) පිටපතක් සැපයීම මගින් කළ යුතුය.

| ______________________ | ______ | ______________________ | ______ |
|---|---|---|---|
| සේවා යෝජකයාගේ නම සහ අත්සන | දිනය | සහායකයාගේ නම සහ අත්සන | දිනය |

* අනවශ්‍ය වචන මකන්න
☐ සුදුසු පරිදි හරි දමන්න